www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 3 ඒකකය |
|---|---|---|

## තෙරුවන් ගුණ හැඳිනගනිමු.

### I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. තෙරුවන් ගුණ කොපමණද?
   i. 24 කි  ii. 23 කි  iii. 22 කි  iv. 25 කි

2. බෞද්ධයෙක් වීමේ පළමු පියවර වනුයේ,
   i. සිල් ආරක්ෂා කිරීම  iii. දන් පූජා කිරීම
   ii. සිත සමාධි ගත කිරීම  iv. තෙරුවන් සරණ යෑම

3. ඉතිපිසෝ පාඨයේ සඳහන්වන බුදුගුණ ගණන කොපමණද?
   i. 06 යි  ii. 08 යි  iii. 09 යි  iv. 10 යි

4. ස්වාක්ඛාත දහම් ගුණ පාඨයේ දහම් ගුණ ප්‍රමාණය කොපමණද?
   i. 06 යි  ii. 07 යි  iii. 05 යි  iv. 09 යි

5. ''රහසත් පව් නොකොට'' යන කවි ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
   i. ගුත්තිල කාව්‍ය  iii. සුභාෂිතය
   ii. ලෝවැඩ සඟරාව  iv. බුදුගුණ අලංකාරය

6. බුදු රජාණන් වහන්සේ සුගත යනුවෙන් හඳුන්වන්නේ,
   i. සුන්දර වචන ඇති නිසා  iii. භාග්‍යවන්ත බව නිසා
   ii. සියළු කෙලෙස් නැසූ නිසා  iv. මැනවින් දහම් දේශනා කළ නිසා

7. ගිහියාගේ නිත්‍ය සීලය ලෙස හඳුන්වන්නේ,
   i. ගිහි දස සිල්ය  iii. පංච සීලයයි
   ii. ආජීව අෂ්ටමක සීලයයි  iv. උපසම්පදා සීලයයි

8. සුපටිපන්න පාඨයේ ඇතුළත් සංඝරත්නයේ ගුණ සංඛ්‍යාත්මකව ප්‍රමාණය කොපමණද?
   i. 06 යි  ii. 07 යි  iii. 08 යි  iv. 09 යි

9. මහා සංඝරත්නය දොහොත් මුදුන් දී නමස්කාරයට සුදුසුවන නිසා,
   i. අඤ්ජලිකරණීය වේ  iii. අකාලික වේ
   ii. පාහුණෙය්‍යය වේ  iv. සුපටිපන්න වේ

10. ගේහසිත සීලය ලෙස හඳුන්වන්නේ,
    i. අටසිල්ය  ii. දසසිල්ය  iii. පන්සිල්ය  iv. මේ සියල්ලමය



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

## II කොටස

- **පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

02. 1. බුදු ගුණ කවියෙන් වර්ණනා කර ඇති ග්‍රන්ථයක් සඳහන් කරන්න.
    2. තෙරුවනෙහි සූවිසි ගුණ බෙදා සඳහන් කරන්න.
    3. තෙරුවන් ගුණ දන ඇති කරගන්නා පැහැදීම හඳුන්වන්නේ කිනම් නමකින්ද?
    4. ගිහියන් ආරක්ෂා කරන සිල් වර්ග හතරක් නම් කරන්න.
    5. පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.
       ''රහසින්වත් පව් නොකොට''

03. 1. ආමිස පූජා පැවැත්වීම සඳහා අප කරන ක්‍රියා හතරක් සඳහන් කරන්න.
    2. ආමිස පූජා යන්නෙහි අදහස කෙටියෙන් සඳහන් කරන්න.
    3. ආමිස පූජාවේ මෙන්ම ප්‍රතිපත්ති පූජාව ද සිදු කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

04. 1. සංඝ රත්නයේ ගුණ නවය වෙන් කර ලියන්න.
    2. ඉන් එක් ගුණයක අදහස පැහැදිලි කරන්න.
    3. වර්තමාන මහා සංඝ රත්නය ශාසනය ආරක්ෂා කරගැනීම සඳහා ක්‍රියා කරන අයුරු පැහැදිලි කරන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk